ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

Sri Lanka
YOU'LL COME BACK FOR MORE

# විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

# පුරප්පාඩු

## කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත් පදනම)

ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාව මතකයේ රැඳෙන ලොව සජීවී සහ විවිධ අත්දැකීම් වලින් පිරි දිවයිනක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ දැක්ම මත කටයුතු කරනු ලබන ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTPB) විසින් කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත් පදනම) තනතුර සඳහා විශිෂ්ඨ සන්නිවේදන කුසලතාවයක් සහිත පාරිභෝගික සත්කාරයෙහි දක්ෂ ප්‍රියමනාප මනා පෞරුෂයකින් හෙබි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

තෝරා ගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සංචාරක තොරතුරු මධ්‍යස්ථාන (කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ,කොළඹ ආදි) වෙත අනුයුක්ත කෙරේ.

**සංචාරක තොරතුරු මධ්‍යස්ථාන සඳහා කළමනාකරණ සහකාර (වසර 01 කොන්ත්‍රාත් පදනම)**

**මූලික අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස.(සා/පෙ) විභාගයෙන්, සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ , ගණිතය ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ ඇතුළුව එක් වරකදී විෂයයන් හයක් (06) සමත් වී තිබීම,

හා

අ.පො.ස.(උ /පෙ) විභාගයෙන් විෂයයන් තුනක් (03) සමත්ව සිටීම (පොදු ප්‍රශ්න පත්‍රය සහ/හෝ පොදු ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය හැර)

**වයස් සීමාව**

අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය

**අමතර සුදුසුකම්**

- ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ හැකියාව (විශේෂයෙන් ම කථන හැකියාව සලකා බලනු ලැබේ.)
- විදේශ භාෂා සම්බන්ධ දැනුම.
- සමාන ක්ෂේත්‍රයක පළපුරුද්ද.

**මාසික වැටුප් පරිමාණය**

රු. 40,403.00 + ජීවන වියදම් දීමනාව

**අතිරේක ප්‍රතිලාභ**

EPF දායකත්වය - මූලික වැටුපෙන් 15% ETF දායකත්වය - මූලික වැටුපෙන් 03%

**අයදුම් පත්‍ර යොමු කිරීමේ පටිපාටිය**

ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු ඇතුළත් ජීව දත්ත පත්‍රිකාවක් උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, අධ්‍යාපන සහතික සහ සේවා සහතිකයන්හි ජායා පිටපත් ද සමග **2025.07.14 දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ පහත ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න.

**සභාපති,**
**ලේක් හවුස් ගොඩනැගිල්ල,**
**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - පහත මාලය 01**
**නො. 35, ඩී. ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**

අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

බඳවා ගැනීම සම්බන්ධව යම්කිසි බලපෑමක් සිදු කිරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් විය හැකිය.

මූලික සුදුසුකම් සපුරන ලද අපේක්ෂකයන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**සභාපති,**
**ලේක් හවුස් ගොඩනැගිල්ල,**
**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - පහත මාලය 01**
**නො. 35, ඩී. ආර්. විජේවර්ධන මාවත,**
**කොළඹ 10.**

SELACINE